සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளீர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/03/ACC - පොදු

ඔබේ අංකය / உமது இல / Your No: ..............................................

දිනය / திகதி / Date: 2024.08.02

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය,
..................................

**සමෘද්ධි ප්‍රජා මුල බැංකු හා බැංකු සමිති සතු අරමුදල් රාජ්‍ය බැංකු වල ආයෝජනය කිරිම**

සමෘද්ධි ප්‍රජා මුල බැංකු හා බැංකු සමිති අරමුදල් ආයෝජනය කිරීමේදී ආයෝජන සිදු කල යුතු රාජ්‍ය බැංකු හා එම බැංකු වල ආයෝජනය කල යුතු අරමුදල් හි උපරිම ප්‍රතිශත පිළිබද ලබා දුන් විධානයන් ක්‍රියාත්මක කිරීම සදහා ප්‍රජා මුල බැංකු කළමනාකරණ මණ්ඩල අනුමැතිය යටතේ නිකුත් කරනු ලැබූ 2018 අංක 07ට පළමු එකතුව අනුව සිදුවේ.

02.එම චක්‍රලේඛය අනුව ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකු 03 හි ආයෝජන මුදල් වල එකතුවෙහි ප්‍රතිශතය 75% ක්ද, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව යන අනෙකුත් බැංකු 03 හි ප්‍රතිශතය 25% ක්ද නොඉක්මවන පරිදි ආයෝජන සිදුකල යුතුය.

03. එසේ වුවද වර්තමානයේ ආයෝජන කටයුතු සිදුකිරීමේදී රාජ්‍ය බැංකුවක් වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙතින් ආයෝජන සදහා විමසීම් සිදු කිරීම සිදුවන්නේ ඉතා අල්ප වශයෙන් බව අප වෙත වාර්ථා කරඇත.

04. ස්ථාවර තැන්පතු ලබා දීමේදී ඒ සදහා වටිනා විශේෂ පොලියක් ලබා දීමටත් ඒ සදහා පූර්ණ රාජ්‍ය බැංකුවක මූල්‍ය ආරක්ෂාව සැපයීමටද කටයුතු කරන බවද වැඩිදුරටත් දන්වා ඇත.

05. එබැවින් ඔබ දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු සමිති හරහා සිදු කරන ආයෝජන සදහා රාජ්‍ය බැංකු වලින් මිළ ගණන් කැදවන අවස්ථාවලදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ද විමසීම් කටයුතු කරන ලෙස අදාල බැංකු සමිති කළමනාකරුවන්ට උපදෙස් ලබා දෙන මෙන් මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

සී.ඩී කළුආරච්චි.
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත 01. ප්‍රධාන විධායක නිලධාරි - සාමාන්‍යාධිකාරි, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව. - කා.දැ.ස

02. කළමනාකරු. සමෘද්ධි ප්‍රජා මුල බැංකු සමිතිය. .................. - අ.ක. ස

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |